# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1674 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 05 /11/2024
පැය 0545

## මාධ්‍ය නිවේදනය

**01. ගිනි අවි හා තියුණු ආයුධ සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශය.**

2024.11.04 වන දින සවස් කාලයේ ඇඹිලිපිටිය පොලිස් වසමේ කොතලාවල හන්දිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **AK47 වර්ගයේ ගිනි අවියක්, පිස්තෝල වර්ගයේ ගිනි අවියක්, 7.62 පතරොම් 25 ක්, 9 mm පතරොම් 07 ක්, එම පතරොම් ගැබක්, AK47 පතරොම් බහාලන මැගසිනයක්, කඩු 02 ක් හා පිහියක් සමග සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇඹිලිපිටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 59 ක් වන ඇඹිලිපිටිය ප්‍රදේශයේ පදිංචි විශ්‍රාමික ආරක්ෂක හමුදා සාමාජිකයෙකු බවට අනාවරණය වී ඇත.**

සැකකරු සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී සංවිධානාත්මක අපරාධකරුවෙකු හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකුගේ සමීපතමයෙකු බවට අනාවරණය වී ඇත.

ඇඹිලිපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.11.04 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ගුවන්තොටුපල හන්දිය ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 42 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**03. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.**

2024.11.04 වන දින රාත්‍රී කාලයේ මොරටුව පොලිස් වසමේ ලක්ෂපතිය ප්‍රදේශයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 02 ක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 250 ක් හා හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 120 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 32 හා 48 වයස්වල පසුවන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.11.04 වන දින සවස් කාලයේ බොරැල්ල පොලිස් වසමේ හල්ගහකුඹුර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 780 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දෙමටගොඩ පොලිස් ස්ථානය.**

2024.11.04 වන දින රාත්‍රී කාලයේ දෙමටගොඩ පොලිස් වසමේ මාලිගාවත්ත සමූපාකාර තොග වෙළෙඳ සංස්ථාව අසලදී දෙමටගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 850 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන කොළඹ 08 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙමටගොඩ පොලිසිය  වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය.**

2024.11.04 වන දින රාත්‍රී කාලයේ පැලියගොඩ පොලිස් වසමේ පෝරණුකොටුවත්ත ප්‍රදේශයේදී පැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 600 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන පැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පැලියගොඩ පොලිසිය  වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**07. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බෙම්මුල්ල පොලිස් ස්ථානය.**

2024.11.04 වන දින රාත්‍රී කාලයේ බෙම්මුල්ල පොලිස් වසමේ කොරස ප්‍රදේශයේදී බෙම්මුල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 67 ක් සන්තකයේ තබාගෙන ත්‍රීරෝද රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු** ත්‍රීරෝද රථයද සමඟින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බෙම්මුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

## 08. තුවාල ලබා සිටි පුද්ගලයෙකු මිය යාමක් - බිංගිරිය පොලිස් වසම.

2024.11.04 වන දින රාත්‍රී කාලයේ බිංගිරිය පොලිස් වසමේ විලත්තව දුම්මලසූරිය මාර්ගයේ විලත්තව හන්දියේදී පුද්ගලයෙකු මාර්ගයේ වැටී සිටින බවට 119 මධ්‍යස්ථානයෙන් බිංගිරිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. මෙම පුද්ගලයා කුලියාපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් අනාවරණය වී නොමැත.**

මරණකරුගේ හිසට බරපතල තුවාල සිදු වී ඇති බවට විමර්ශණයේදී නිරීක්ෂණය වී ඇත. මෙම මරණය රිය අනතුරකින් සිදු වූවාද යම් අපරාධයකින්ද යන්න පිළිබඳව මෙතෙක් අනාවරණය වී නොමැත.

මෘත ශරීරය කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බිංගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මුව මස් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නාත්තේරිය පොලිස් ස්ථානය.

2024.11.04 වන දින උදෑසන කාලයේ නාත්තේරිය පොලිස් වසමේ කාටුවැව ප්‍රදේශයේදී නාත්තේරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මැරීමට තහනම් සතෙකු වන මුවෙකුගේ මස් කිලෝග්‍රෑම් 02 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන මහනාත්තේරිය, ගල්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නාත්තේරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

## 10. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගිරිබාව පොලිස් ස්ථානය.

2024.11.04 වන දින උදෑසන කාලයේ ගිරිබාව පොලිස් වසමේ ජයන්තිපුර ප්‍රදේශයේදී ගිරිබාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන ජයන්තිපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගිරිබාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - ඇහැලියගොඩ පොලිස් වසම.

2024.11.04 වන දින උදෑසන කාලයේ ඇහැලියගොඩ පොලිස් වසමේ මින්නාන ඉද්දමල්ගොඩ මාර්ගයේ සොමිසඳවත්ත ප්‍රදේශයේදී ඉද්දමල්ගොඩ සිට මින්නාන දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ පෙරලී යාමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා අවිස්සාවේල්ල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 58 ක් වූ ගැටහැත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඇහැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - බණ්ඩාරගම පොලිස් වසම.

2024.11.04 වන දින උදෑසන කාලයේ බණ්ඩාරගම පොලිස් වසමේ බණ්ඩාරගම පානදුර මාර්ගයේ බොල්ගොඩ ප්‍රදේශයේදී බණ්ඩාරගම දෙස සිට පානදුර දෙසට වම් මංතීරුවේ පිළිසකර කටයුත්තක් හේතුවෙන් බණ්ඩාරවෙල දෙස සිට පානදුර දෙසට ධාවනය වූ බස් රථයක් දකුණු මංතීරුවෙන් ධාවනය කර නැවත වම් මංතීරුවට ගැනීමේදී පානදුර දෙස සිට බණ්ඩාරගම දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ පිටුපස අසුනේ ගමන් කල තරුණියක් බරපතල තුවාල ලබා බණ්ඩාරගම රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා හොරණ රෝහල වෙත මාරුකර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 23 ක් වූ බණ්ඩාරගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර. බණ්ඩාරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**